***සැ.යු.:*** මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2025 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,444 - 2025 අගෝස්තු මස 01 වැනි සිකුරාදා - 2025.08.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 272 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 283 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 22 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


271 - B 082705 - 353 (2025/08)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉරේෂා ලියනගම වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.12.08 දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/8205 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන විගමුව පදිංචි ජයවික්‍රම ආරච්චිගේ සියදෝරිස් වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1378 යටතේ 1988.04.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුවේ/කෝරළේ විගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, විගමුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සම්පාදිත අංක අ. ග. සි. 258 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 311 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.343 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : ලොට් 271 ප්‍රවේශ මාර්ගය,
*නැගෙනහිරට* : ලොට් 274 ප්‍රවේශ මාර්ගය,
*දකුණට* : ලොට් 314 ඉඩම් කැබැල්ල,
*බස්නාහිරට* : ලොට් 310 ඉඩම් කැබැල්ල

ඉරේෂා ලියනගම,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තංගල්ල.

2025 අප්‍රේල් මස 21 වැනි දින.

08 - 08/01

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1999.03.05 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර50850 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන අංක 536 කු. ග. 11, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර පදිංචි ඉද්දමල්ගොඩ දිසානායක පියසේන වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/95/2674/99 යටතේ 1999.07.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,මාගම්පත්තුවේ/කෝරළේ වීරවිල නව නගරය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දකුණු ඉවුර, කුඩා ගම්මාන 11 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, දලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 536 (වගා) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : බස්නා ඇල,
*නැගෙනහිරට* : අංක 537 වගා ඉඩම,
*දකුණට* : අංක 41 කෙත් ඇල,
*බස්නාහිරට* : අංක 535 වගා ඉඩම.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2023 සැප්තැම්බර් මස 11 වැනි දින.

08 - 08/02

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.11.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/7752 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන තල්වත්ත පදිංචි වීරප්පුලිගේ සලොංචිනා වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1295 යටතේ 1988.04.07 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ/තල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තල්වත්ත නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අවසාන ගම් පිඹුරු අංක 202 දරන රේඛා සටහනේ අංක 125 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.328 ක් විශාලත්වය ඇත්තා වූ ද, එගොඩවත්තහේන නමැති පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : ලොට් 123 දරන බිම් කැබැල්ල ද, |
| *නැගෙනහිරට* | : ලොට් 129 දරන බිම් කැබැල්ල ද, |
| *දකුණට* | : ලොට් 126 දරන බිම් කැබැල්ල ද, |
| *බස්නාහිරට* | : ලොට් 124 දරන ප්‍රවේශ මාර්ගය ද වේ. |

ආර්. ඒ. චතුරි දමිත්‍රා,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2025 ජනවාරි මස 23 වැනි දින.

08 - 08/03

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වන්නිආරච්චි වනිගසේකර චින්තා පද්මිණි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2009.03.31 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/2/ප්‍ර/57476 දරන ප්‍රදාන පත්‍රය හුංගම, තුඩුව ලිපිනයෙහි පදිංචි ඩැනී ශ්‍රී වර්ණසිංහ අබේරත්න යන අය වෙත ප්‍රදානය කොට ඇති අතර අම්බලන්ගොඩ ලියනගේ ගුණවතී නමින් මුල් අයිතිය සහතික කර ඇත. එකී ප්‍රධාන පත්‍රයේ පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ 178, හුංගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලෙකණුකැටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, හම්බන්තොට මැනුම් අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 455 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 848 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.304 ක විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, කපුළුළිය ගොඩ ඉඩම නමැති රජයේ ඉඩම,

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 847 හා මාර්ගය, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 857 ඉඩම, |
| *දකුණට* | : කැබලි අංක 849 ඉඩම, |
| *බස්නාහිරට* | : පාර රක්ෂිතය. |

චින්තා පී ඩබ්. වන්නිආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2025 අප්‍රේල් මස 09 වැනි දින.

08 - 08/04

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් රණවීර ආරච්චිගේ චතුරි දමිත්‍රා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1990.10.23 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/16471 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දරම්ටිආර පදිංචි හිගහත්තේ සිරියාවතී වෙත ප්‍රදානය කොට තංගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1240 යටතේ 1994.07.04 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරු ගිරුවා පත්තුවේ තල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දරම්ටිආර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අවසාන ගම් පිඹුරු අංක 201 දරන රේඛා සටහනේ අංක 155 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.482 ක් විශාලත්වය ඇත්තා වූ ද, මාරගහවත්ත නමැති පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : 162 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : 156 හා 162 කැබැල්ල, |
| *දකුණට* | : 160 හා 159 කැබැල්ල, |
| *බස්නාහිරට* | : 161 හා 162 කැබැල්ල. |

ආර්. ඒ. චතුරි දමිත්‍රා,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2025 ජනවාරි මස 23 වැනි දින.

08 - 08/05

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.04 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 40773 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 183 පදිංචි, කුඩාගම්මාන 06, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර හි පදිංචි වලිසාදීර ඇඩ්වින් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/308/1570/2000 යටතේ 2000.05.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ අභයපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු ඉවුර, කුඩාගම් 06 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති රේඛා සටහනේ අංක 371 කුඹුර දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : බස්නා ඇළ, |
| *නැගෙනහිරට* | : අංක 372 ආර්. ඒ. ගුණදාසගේ ඉඩම, |
| *දකුණට* | : අංක 370 කුඹුරු ඉඩම, |
| *බස්නාහිරට* | : අංක 31 කෙත් ඇළ. |

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2025 මාර්තු මස 03 වැනි දින.

08 - 08/06

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.12.13 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 27719 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 183, කුඩාගම්මාන 06, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර හි පදිංචි වලිසාදීර ඇඩ්වින් වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/308/1571/2000 යටතේ 2000.05.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 උප වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ, අභයපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දකුණු ඉවුර, කුඩාගම් 06 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අ. භූ. පි. 3 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක ක. සි. 830002 දරන රේඛා සටහනේ අංක 64 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2101 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

*උතුරට* : අංක 63,
*නැගෙනහිරට* : අංක 270 ප්‍රධාන ඇළ රක්ෂිතය,
*දකුණට* : අංක 65,
*බස්නාහිරට* : අංක 77 ප්‍රවේශ මාර්ගය.

අයි. එල්. වික්‍රමනායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගම්වෙහෙර.

2025 මාර්තු මස 03 වැනි දින.

08 - 08/07

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් සිතාරා රුවිනි ගමගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.09.15 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/අකෝ/2124 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගිනිගත්හේන පදිංචි මීදෙනියගේ සයිමන් මීදෙනිය මහතා වෙත ප්‍රදානය කොට ගම්පොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. බී. 13/196 යටතේ 1997.11.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව පත්තුවේ/කෝරළේ සමන්සිරිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, සමන්සිරිගම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් පමණක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම: පඹහේන ජනපදය

*උතුරට* : ආර්. ඒ. කරුණාවතී හිමිකම් කියන ඉඩම,
*නැගෙනහිරට* : පඹහේන ඇල රක්ෂිතය,
*දකුණට* : එම්. කේ. ප්‍රේමරත්න හිමිකම් කියන ඉඩම,
*බස්නාහිරට* : මළ ඇළ රක්ෂිතය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2025 ජනවාරි මස 06 වැනි දින.

08 - 34

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.01.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1919 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ධර්මපාලපුර, රුවන්එළිය පදිංචි ධනපාල මුදියන්සේලාගේ සෝමදාස මයා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/35/108/2000 අංකය යටතේ 2000.03.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත්සතර කෝරළේ වින්ඩ්කෝනර් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ධර්මපාලපුර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම, ධර්මපාලපුර

| | |
|---|---|
| *උතුරට* | : චන්ද්‍රසිරි නිවුන්හැල්ලගේ භුක්ති විඳින ඉඩම, |
| *නැගෙනහිරට* | : ව. මු. ප්‍රේමදාසගේ ඉඩම, |
| *දකුණට* | : අබ්දුල් මජිඩ්ගේ ඉඩම, |
| *බස්නාහිරට* | : ජනපද මාර්ග රක්ෂිතය. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් මස 10 වැනි දින.

08 - 36/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1987.10.15 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/4660 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බ්ලැක්පූල් (රුවන්එළිය) පදිංචි මාග්‍රට් ලෝෂන් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ11/46/88 අංකය යටතේ 1988.01.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත, පත්තුවේ/කෝරළේ බ්ලැක්පූල් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බ්ලැක්පූල් (රුවන්එළිය) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක දරන 69/6/3 ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පි. පි. නු. 852 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.071 ක් ඇතැයි ගණන් බලා තිබෙන බ්ලැක්පූල් (රුවන්එළිය) යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. නු. 852 පිඹුරේ කැබලි අංක 35 සහ 38, |
| *නැගෙනහිරට* | : පි. පි. නු. 852 පිඹුරේ කැබලි අංක 40, |
| *දකුණට* | : පි. පි. නු. 852 පිඹුරේ කැබලි අංක 51, |
| *බස්නාහිරට* | : පි. පි. නු. 852 පිඹුරේ කැබලි අංක 34. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් මස 25 වැනි දින.

08 - 36/2

නුඑ/3/2/3/2/මිපු/84

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් /නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2004.08.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1967 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මිහිදුපුර පදිංචි ගජධීර ආරච්චිලාගේ ජීසන් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ28/1295/2004 අංකය යටතේ 2004.12.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර, කෝරළේ මිහිදුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රුවන්එළිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 69/6/1 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මූ. පි. නු. 2102 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 01 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0890 ක් ඇතැයි ගණන් බලා තිබෙන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : මූ. පි. නු. 851 පිඹුරේ කැබලි අංක 10, |
| *නැගෙනහිරට* | : මූ. පි. නු. 851 සඳහන් කැබලි අංක 11 හා මාර්ගය, |
| *දකුණට* | : මූ. පි. නු. 2102 හි කැබලි අංක 02 හා මාර්ගය, |
| *බස්නාහිරට* | : මූ. පි. නු. 851 හි කැබලි අංක 22. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් මස 14 වැනි දින.

08 - 36/3

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1989.05.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1803 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මිපිළිමාන, ජයවර්ධනපුර පදිංචි කෙසෙල්කඩුව විතානගේ මාග්‍රට් ඩයස් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ30/796/99 අංකය යටතේ 1999.08.11 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර, කෝරළේ මිපිළිමාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ජයවර්ධනපුර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, අංක නුව/79/2 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 62 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 2 ක් ඇතැයි ගණන් බලා තිබෙන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : අංක 45 ඉඩම, |
| *නැගෙනහිරට* | : අංක 63 ඉඩම, |
| *දකුණට* | : ජනපද මාර්ගය, |
| *බස්නාහිරට* | : අංක 61 ඉඩම. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 නොවැම්බර් මස 19 වැනි දින.

08 - 36/4

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.14 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/1528 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රත්නගිරිය පදිංචි සමයමන්ත්‍රි පටබැඳිගේ අමරදාස මයා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/38/2538/96 අංකය යටතේ 1996.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ රත්නගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රත්නගිරිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, රජයේ මිනින්දෝරු විසින් සම්පාදිත අංක නුවි/81/9 දරන කට්ටි කැබීමේ පිඹුරේ 39 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම. රත්නගිරිය ජනපදය

*උතුරට* : කැබලි අංක 40 සහ රක්ෂිතය,
*නැගෙනහිරට* : කැබලි අංක 38 සහ රක්ෂිත කැලය,
*දකුණට* : කැබලි අංක 38,
*බස්නාහිරට* : ප්‍රධාන මාර්ගය.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 ඔක්තෝබර් 10 වැනි දින.

08 - 36/5

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2014.01.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක GR/6/002973 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මීපිළිමාන, නුවරඑළිය පදිංචි සැමුවෙල් යූජිනියා වයලට් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ LDO A/04/48 අංකය යටතේ 2014.02.12 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ 476 එච්. මීපිළිමාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මීපිළිමාන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, මැනුම් අධිකාරි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, අංක මු. පි. නු. 2600 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 53 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2023 ක් ඇතැයි ගණන් බලා තිබෙන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 52 සහ මු. පි. නු. 279 හි කැබලි අංක 01,
*නැගෙනහිරට* : මු. පි. නු. 279 පිඹුරේ කැබලි අංක 01,
*දකුණට* : කැබලි අංක 55 සහ මු. පි. නු. 279 හි කැබලි අංක 01,
*බස්නාහිරට* : කැබලි අංක 55 සහ 54.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 අගෝස්තු 15 වැනි දින.

08 - 36/6

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.11.25 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/851 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගල්පාලම පදිංචි පාදිනාවෙල මැදගෙදර පොඩිනා යන අය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/2/124/86 අංකය යටතේ 1986.02.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති අතර 2001.10.09 වැනි දින නුඑ 02/1248/2001 ලියාපදිංචි කරන ලදුව විජේකෝන් මුදියන්සේලාගේ ආරියරත්න යන අයට මුල් අයිතිය ලබා දී ඇත. පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත් සතර/කෝරළේ 534 ඒ ගල්පාලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පාලම, කඳපොල (කොටසක) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක එම්. 37, 44, 45/6 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පී. පී. ඒ. 1068 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 33 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01, පර්චස් 11 ක් ඇතැයි ගණන් බලා තිබෙන ගල්පාලම වත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : පී. පී. ඒ. 1068 හි සැලැස්මේ කට්ටි අංක 32, |
| *නැගෙනහිරට* | : පී. පී. ඒ. 1068 හි සැලැස්මේ කට්ටි අංක 35, |
| *දකුණට* | : අඩි පාර, |
| *බස්නාහිරට* | : ඉවුර. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින.

08 - 36/7

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.09.22 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/3375 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගල්පාලම පදිංචි මිරිස්සගේ දෝන පොඩිහාමිනේ වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 08/496/87 අංකය යටතේ 1987.05.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ 534 ඒ ගල්පාලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පාලම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, ඔහු භාරයේ ඇති අංක 69/1/1, 69/1/2, 69/1/3, 69/1/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පී. පි. නු. 869 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 13 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.129 ක් ඇතැයි ගණන් බලා තිබෙන ගල්පාලම යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

| | |
|---|---|
| *උතුරට* | : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 01, |
| *නැගෙනහිරට* | : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 12, |
| *දකුණට* | : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් මායිම් ගල, |
| *බස්නාහිරට* | : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 14. |

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින.

08 - 36/8

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1993.07.29 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/174 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන මීපිළිමාන, මිහිදුපුර පදිංචි කටුවාගලගේ දයාවතී වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 28/600/93 අංකය යටතේ 1993.12.15 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ/කෝරළේ මිහිදුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සීතාඑළිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක දරන පී53බී/අ.අ.3 ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක කැ. මැ. මු. පි. 53බී දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 124 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.049 ක් ඇතැයි ගණන් බලා තිබෙන මාගොඩ පතන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

*උතුරට* : කට්ටි අංක 45,
*නැගෙනහිරට* : කට්ටි අංක 45,
*දකුණට* : කට්ටි අංක 131,
*බස්නාහිරට* : කට්ටි අංක 123.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 සැප්තැම්බර් මස 05 වැනි දින.

08 - 36/9

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.08.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/3038 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මාගස්තොට IV වන පියවර පදිංචි ජෝෂප් ප්‍රැන්සිස් වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 11/334/87 අංකය යටතේ 1987.05.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත පත්තුවේ/කෝරළේ බ්ලැක්පූල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බ්ලැක්පූල් (රුවන්එළිය) නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති අංක පී. පී. නු. 852 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 32 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.067 ක් ඇතැයි ගණන් බලා තිබෙන මාගස්තොට IV වන පියවර යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

*උතුරට* : පී. පී. නු. 852 පිඹුරේ කැබලි අංක 28 සහ 31,
*නැගෙනහිරට* : පී. පී. නු. 852 පිඹුරේ කැබලි අංක 33,
*දකුණට* : පී. පී. නු. 852 පිඹුරේ කැබලි අංක 51,
*බස්නාහිරට* : පී. පී. නු. 852 පිඹුරේ කැබලි අංක 27.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 අගෝස්තු මස 26 වැනි දින.

08 - 36/10

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.08 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/614 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරුවන බ්ලැක්පූල් නව ජනපදය හි පදිංචි මුත්තු කාතන් පලනිවේලු මයා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 11/1119/95 අංකය යටතේ 1995.12.18 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ වින්ඩ්කෝනර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලැක්පූල් නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති සහ රජයේ මිනින්දෝරු නිමල් ලියනගේ විසින් සම්පාදිත අංක නු/වි/86/83 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 101 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් පර්චස් 20 පමණ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : මාර්ගය,
*නැගෙනහිරට* : ලොට් අංක 100,
*දකුණට* : සුසාන භූමිය,
*බස්නාහිරට* : මාර්ගය.

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 පෙබරවාරි මස 19 වැනි දින.

08 - 36/11

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩී. ඒ. පී. දනන්සූරිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.09.22 වැනි දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/3381 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගල්පාලම පදිංචි පුංචිහේවාගේ ඩේසි නෝනා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 08/490/87 අංකය යටතේ 1987.05.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ 534 ඒ ගල්පාලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්පාලම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, ඔහු භාරයේ ඇති අංක 69/1/1, 69/1/2, 69/1/3, 69/1/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක පී. පී. නු. 869 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 19 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.232 ක් ඇතියි ගණන් බලා තිබෙන ගල්පාලම යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 18,
*නැගෙනහිරට* : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් මායිම් ගල,
*දකුණට* : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 20,
*බස්නාහිරට* : පී. පී. නු. 869 පිඹුරේ සඳහන් කැබලි අංක 01,

ඩී. ඒ. පී. දනන්සූරිය,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2024 පෙබරවාරි මස 26 වැනි දින.

08 - 36/12

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, තලවකැලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එස්. එස්. ප්‍රේමසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988.08.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/එ/ප්‍ර/5786 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වටගොඩ වත්ත පදිංචි නෙයිනා මොහමඩ් හබුල් හසන් මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/26/354/89 අංකය යටතේ 1989.03.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිඹුල කෝරළේ 475 ඊ තලවකැලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වටගොඩ නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍රයෙහි පී. පී. නු. 1193 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 34 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.144 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම.

*උතුරට* : කැබලි අංක 33 සහ 32,
*නැගෙනහිරට* : කැබලි අංක 31,
*දකුණට* : කැබලි අංක 21,
*බස්නාහිරට* : කැබලි අංක 35.

එස්. එස්. ප්‍රේමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලවාකැලේ.

2024 පෙබරවාරි මස 11 වැනි දින.

08 - 42

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළියදිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.06.05 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/තිස්/02/ප්‍ර/ගො/138 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තිස්පනේ අංක 2, නව තිස්පනේ හි පදිංචි දේවසිංහ මුලාචාරි ගම්ලත්ගේ නාමසිංහ වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කො156/1093/2000 යටතේ 2000.11.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ 462 සීකටුගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තිස්පනේ උඩගම්මැද්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය මැනුම් අධිකාරි භාරයේ ඇති අංක නු. 1370 දරන කට්ටි කැබීමේ පිඹුරේ 24 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.534 ක් (බිංදුවයි දශම පහයි තුනයි හතර) විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - තිස්පනේ වත්ත.

*උතුරට* : කැබලි අංක 28 සහ 23,
*නැගෙනහිරට* : කැබලි අංක 23 සහ 22,
*දකුණට* : කැබලි අංක 25,
*බස්නාහිරට* : කැබලි අංක 25 සහ 28.

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උප කාර්යාලය.

2024 අගෝස්තු මස 21 වැනි දින.

08 - 43/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ආර්. ඒ. නදීර ලක්මාල් වන මම, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2000.05.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/කොත්/තිස්/01/ප්‍ර/ගො/217 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තිස්පනේ අංක 1, නව තිස්පනේ, නාවලපිටිය හි පදිංචි වෙලගමතැන්නේ ලංකේෂ්වර ගෙදර ජුවන්නයිදේ වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කොත්166/1338/2000 යටතේ 2000.12.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2025.08.22 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්පනේ කෝරළේ 462 සීකටුගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තිස්පනේ උඩගම්මැද්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, නුවරඑළිය මැනුම් අධිකාරි භාරයේ ඇති මැනුම් අධිකාරී විසින් සම්පාදිත අංක නු. 1369 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 128 දරන බිම් කැබැල්ල වශයෙන් ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.311 (බිංදුවයි දශම තුනයි එකයි එක) ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම - තිස්පනේ වත්ත.

*උතුරට* : කැබලි අංක 130,
*නැගෙනහිරට* : කැබලි අංක 127,
*දකුණට* : කැබලි අංක 127 සහ 131,
*බස්නාහිරට* : කැබලි අංක 130.

ආර්. ඒ. නදීර ලක්මාල්,
ප්‍රාදේශීය ලේකම්,
තිස්පනේ උප කාර්යාලය.

2024 අගෝස්තු මස 21 වැනි දින.

08 - 43/2

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/58330.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :* NWP/PLC/L10/KL/LTL/39.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 629A කන්දකුලිය ග්‍රාම නිලධාරි වසමේ, ඊච්චන්කාඩුව ගමේ පිහිටි ජනපද නිලධාරි විසින් සකස් කරන ලද අනුරේඛන අංක KLP/LAND/2022/22 දරන අනුරේඛනය මඟින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 21, රූඩ්. 02, පර්. 10 ක් වූ රජයේ ඉඩම් කොටස, පොල් වගා කිරීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝකාලීන බද්දක් මත ලබාදෙන ලෙස ආඩම්බරගේ ගොඩ්ෆ්‍රි නිමල් කැමිලස් ද අල්විස් මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : තුරුක්කි තෝට්ටම් (රජය) සහ තරව,
*නැගෙනහිරට* : තුරුක්කි තෝට්ටම් (රජය) සහ මාර්ගය,
*දකුණට* : තුරුක්කි තෝට්ටම් (රජය),
*බටහිරට* : තුරුක්කි තෝට්ටම් (රජය).

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි (30) (2025.02.27 දින සිට 2055.02.26 දක්වා);

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ රුපියල් මිලියන පහට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

(ඇ) මෙම ඉඩම **කෘෂිකාර්මික කටයුතු මිස** වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඌ) 2025.02.27 දින සිට වසර 05 ක් ගත වන තුරු බදුගත් කරුණ සාක්ෂාත් කරගැනීම සඳහා වන අතුරු බදු සහ පැවරීම් හැර වෙනත් අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 ජූලි මස 16 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08 - 35

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2025.08.01 | සිකුරාදා | 2025.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.07 | බ්‍රහස්පතින්දා | 2025.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.15 | සිකුරාදා | 2025.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.08.22 | සිකුරාදා | 2025.08.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.08.29 | සිකුරාදා | 2025.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.